පැලියගොඩ නගර සභාව

ගම්පහ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 05 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 22 දින සභාවේ සභාපතිවරයාට වෙත යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පැලියගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විදුලි, පොදු, සෞඛ්‍ය යන අංශවල රු.5,000,541 ක ඉතිරි තොග වෙන් වෙන්ව ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ණය හිමියන් 13 දෙනෙකුට අදාලව රු.2,175,353 ක් ගෙවීම් කිරීමේදී ණයහිමි ගිණුමට හර කරනු වෙනුවට ණය ගැති ගිණුමට හර කර තිබුණි.

---

(ඇ) පළාත් ආදායම් කාර්යාලයේ (මුද්දර ආදායම්) මුලාා ආධාර ණය අයකිරීම් 2009 හා 2010 වර්ෂ වෙනුවෙන් රු.3,377,795 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේදී ජර්නල් සටහන් අංක 29 මගින් රු.2,399,700 ලෙස ගිණුම් වල දැක්වීම නිසා රු.978,095 කින් ණය ගිණුමේ ශේෂය වැඩිවී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී අගරු චෙක්පත් දෙකක් සඳහා ලැබී තිබූ රු.311,088 ක් ගිණුම් ගතකිරීමේදී අගරු චෙක්පත් ගිණුමට බැර නොකිරීම නිසා පෙර ගෙවුම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2012. දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 05 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.1,492,873 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.355,198,874 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මුලාා හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මුලාා ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූලාා ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 32,600,615 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 5,555,731 ක් විය.

---

2.2 මූල්‍ය පාලනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) අනුව මාස 06 කට වැඩි කාලයක් ඉකුත්වීතිබූ රු.45,083 ක් වටිනා චෙක්පත්14 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව රු.495,045 ක අගරු චෙක්පත් සම්බන්ධයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත, ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 58,485 | 59,331 | 40,653 |
| (ii) | බදු කුලී | 2,278 | 1,519 | 644 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,854 | 1,413 | 1,714 |
| (iv) | වෙනත් ආදායම් | 26,119 | 9,500 | 115 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම් රුපියල් මිලියන 26 ක් ඇස්තමේන්තු කර තිබුණ ද තථ්‍ය අගය රුපියල් මිලියන 9.5 ක් වූයෙන් රුපියල් මිලියන 16.5 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

---

(ආ) නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 164(2) වගන්තිය ප්‍රකාරව හෝටල්, ආපනශාලා හා නවාතැන්පලවල වාර්ෂික ලැබීම් වලින් 1% ක ගාස්තුවක් අයකල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී ආපනශාලා පහකින් රු.3,000 බැගින් අයකර තිබුණි.

(ඇ) නගර සභා ආඥා පනතේ 170 අ (2) වගන්තියේ යොමුගත විධිවිධාන ප්‍රකාර සභාවට අයවිය යුතු ගාස්තු හෝ වෙනත් ගෙවීම් අයකරගෙන එය නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම සභා ලේකම්ගේ කාර්යය වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු වරිපනම් රු.40,652,618 ක්, බදුකුලී රු.644,176 ක් හා බලපත්‍ර ගාස්තු රු.174,212 ක් අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගෙන නොතිබුණි.

2.4 අධිභාර

---------

නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 182 (1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.138,009 ක අධිභාර අයකර ගැනීමට තිබුණි.

2.5 අවිධිමත් ගනුදෙනු

----------------------

සමාලෝචිත වර්ෂයේදී නගර සභාව සඳහා රු.94,248 ක් හා රු.67,200 කට ඇහිලි සළකුණු යන්ත්‍ර දෙකක් මිළදී ගෙන තිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 අගෝස්තු 07 දින රු.94,248 වටිනාකමැති ඇහිලි සළකුණු යන්ත්‍රය ගබඩාවට ලැබුණු අතර, එය අක්‍රීය වීම නිසා නැවත යන්ත්‍රයක් 2012 නොවැම්බර් 22 දින රු.67,200 කට මිළදී ගෙන තිබුණි.

(ආ) පළමුව ලබාගත් යන්ත්‍රය සඳහා වගකීම් සහතිකයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 07 දින නගර සභාවට ලැබුණු මෙම යන්ත්‍රය අක්‍රීය වී ඇති බව දැන තිබියදී, ඒ සඳහා 2012 සැප්තැම්බර් 18 දින රු.94,248 ක් ගෙවා තිබුණි.

2.6 අයවිය යුතු සේවක ණය

---------------------------

2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂවල එකතුව රු.15,049,472 ක් වූ අතර, ඒ තුළ දිගු කාලයක සිට අය නොවී පවතින රු.805,125 ක ශේෂයක් විය.

---

2.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2008 ජූලි 30 දිනැති අංක 1560/6 ගැසට් පත්‍රයේ පළකර ඇති 2008 අංක 01 දරණ $ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති'' සියළුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළයුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති අංක එල්ජීඩී/05/08/පොදු/වෙළුම හා පළාත් පාලන කොමසාරිස්, (බස්නාහිර පළාත) ලිපියෙන් දැනුම් දී තිබුනද, නගර සභාව එකී විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මේ සඳහා ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර, වියදම ලෙස රු.7,700,000 ක ඇස්තමේන්තුවක් තිබුණි. මේ හේතුවෙන් පහත පරිදි ලැබිය යුතු ආදායමක් නගර සභාවට ලැබී නොතිබුණි.

(අ) රීති මාලාවේ අංක 18(1) අනුව අදාළ පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව, කසල දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා එහි 1 උපලේඛණයේ ඇති භාවිත ගාස්තුව නගර සභාව අයකර නොතිබුණි.

(ආ) රීති අංක 09 අනුව නගර සභාව එහි 3 උපලේඛණයේ දැක්වෙන පරිදි සමහර අවස්ථාවලදී පමණක් අපද්‍රව්‍ය ප්‍රමාණය මත ගාස්තු අයකර තිබුණි.

(ඇ) රීති අංක 20 අනුව ඉදිකිරීම් අපද්‍රව්‍ය කැබලි හා සුන්බුන් එකතු කිරීම් සඳහා ද අයකල යුතු ගාස්තු කිසිවක් අයකර නොතිබුණි.

(ඈ) ඒ අනුව රීති අංක 21 හි ඇති $ස්ථාන දඩ'' අයකර කර නොතිබුණි.

(ඉ) රීති අංක 22 ට අනුව ඝන අපද්‍රව්‍ය ආදායමෙන් සියයට 20% ක ප්‍රමාණයක් අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ අරමුදලට බැරකර නොතිබුණි.

(ඊ) 59 රීතියට අනුව නගර සභාව කාබනික ජෛවහනය වන අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට්කරණය හෝ තාක්ෂණික විධි සංවිධානය කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

2.9 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සභාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 05 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

------------------------------------------------------------------------------------------------------------------------

3 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමණාකරණ